සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

**13 ශ්‍රේණිය** | **නාට්‍ය හා රංගකලාව** | **පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 2 ) | 02. ( 5 ) | 03. ( 2 ) | 04. ( 3 ) | 05. ( 1 ) | 06. ( 4 ) | 07. ( 5 ) | 08. ( 2 ) | 09. ( 5 ) | 10. ( 2 ) |
| 11. ( 1 ) | 12. ( 4 ) | 13. ( 3 ) | 14. ( 2 ) | 15. ( 3 ) | 16. ( 1 ) | 17. ( 4 ) | 18. ( 3 ) | 19. ( 1 ) | 20. ( 4 ) |
| 21. ( 1 ) | 22. ( 4 ) | 23. ( 3 ) | 24. ( 1 ) | 25. ( 2 ) | 26. ( 3 ) | 27. ( 1 ) | 28. ( 2 ) | 29. ( 1 ) | 30. ( 4 ) |
| 31. ( 3 ) | 32. ( 4 ) | 33. ( 5 ) | 34. ( 4 ) | 35. ( 4 ) | 36. ( 1 ) | 37. ( 2 ) | 38. ( 3 ) | 39. ( 4 ) | 40. ( 3 ) |

(ලකුණු 40)

## II කොටස

01. (i) ඇරිස්ටෝටල් සිය පොයෙටික්ස් ග්‍රන්ථය තුළ කාල ඒකීයත්වය, ස්ථාන ඒකීයත්වය, කාර්ය ඒකීයත්වය ලෙස ත්‍රිවිධ ඒකීයත්ව පෙන්වා දී ඇත. (ල. 4)

(ii) ඊඩිපස් රජ හෝ ඇන්ටිගනී නාට්‍ය ඇසුරෙන් පැහැදිලි කර තිබීම. (ල. 5)

(iii) ග්‍රීක රංගභූමිය එළිමහන් රංගභූමියකි. ප්‍රේක්ෂකයින් විසිදහසකට අධික ප්‍රමාණයකට නිදහස්ව වාඩි වී නාට්‍ය නැරඹිය හැකිය. ඕකෙස්ට්‍රාව නම් කොටස පසුකාලීනව එක්වීමෙන් වඩාත් ක්‍රමවත් භාවයකට පත්විය. එකේන් (ස්කීන්) ගොඩනැගිල්ල, පාරඩෝස්, ප්‍රොසීනියම්, ඕකෙස්ට්‍රා ආදිය රංගකාර්යේ දී උපකාරී වේ. රූප සටහන ඇඳ නම් කිරීමද උචිතය. (ල. 6)

02. (i) මහා භාරතයේ ආදි පර්වන්හි ශාන්තුතලෝපාඛ්‍යානය මෙන් ම පද්මපුරාණයෙහි ඇතුළත් කථා පුවත් අඩංගුය. එම කතා පුවත් කෙටියෙන් දක්වා තිබීම. (ල. 4)

(ii) දුෂ්‍යන්ත රජු ඉතා හොඳ පුද්ගලයෙක් ලෙස, අසපුවේ මුවාට විදීම වළක්වාලීමෙන් පැහැදිලි වෙයි. නාට්‍ය රසය තීව්‍ර කිරීම සඳහා චරිත ගණනාවක් එක්කොට තිබීම. නාට්‍ය පටන්ගැන්මේ සිට අවසානය දක්වා නාට්‍යයෝචිත පරිදි ශෝකී අවස්ථා හා සිදුවීම් ආදියෙන් ප්‍රේක්ෂක කුතුහලය වර්ධනය කොට තිබීම, සියුම් මනෝභාවික තත්ත්වයන් නිරූපණය කොට තිබීම. උදාහරණ ගනිමින් නාට්‍ය පැහැදිලි කිරීම. (ල. 5)

(iii) බීජ, බිංදු, පතාක, ප්‍රකරි, කාර්ය නිදසුන් ලෙස විස්තර කොට තිබීම. (ල. 6)

03. (i) භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව 'අභි' යනු ඉදිරියට ලෙස ද, 'නය' යනු පැමිණවීම (ගෙනයාම) ලෙසද දක්වා ඇත. නාට්‍යය පිටපතේ අන්තර්ගතය නළුවා විසින් ප්‍රේක්ෂකයා හමුවට ගෙන එනු ලබන්නේ අභිනය මගිනි.

අභිනය අංග 04 කින් යුක්තය. වාචික අභිනය, තාත්වික අභිනය, ආහාර්ය අභිනය, ආංගික අභිනය ලෙසය. (ල. 4)

(ii) සතර අභිනය නොමැති නාට්‍යයක් ප්‍රේක්ෂකයා හමුවට ගෙන යා නොහැක. නළු කාර්ය සඳහා සතර අභිනය යොදාගන්නා අයුරු දක්වා තිබීම. (ල. 5)

(iii) චරිතයක සාර්ථක නිරූපණය සඳහා නළු කාර්ය අත්‍යවශ්‍යයි. පිටපත අධ්‍යනය, චරිතය අවබෝධ කර ගැනීම, රංග අභ්‍යාස වල යෙදීම, අධ්‍යක්ෂකවරයාගේ උපදෙස් පිළිපැදීම, නාට්‍ය පෙළට අර්ථකථන සැපයීම, පරිකල්පන ශක්තිය අනුව චරිතය ගොඩනගා ගැනීම, කාලය, දේශය අවබෝධ කර ගැනීම, නාට්‍ය පුහුණුවීම්, අනුශාංගික ශිල්ප උපයෝගී කර ගනිමින් චරිතය සාර්ථකව නිරූපණය කිරීම ආදිය දක්වා තිබීම. (ල. 6)

04. (i) ඔතලෝ නාට්‍යයෙන් ඔතලෝගේ චරිත නිරූපණය කරන අයුරු දක්වා තිබීම. පිළිතුර තර්කානුකූලව දක්වා තිබීම. (ල. 4)

(ii) ප්‍රභූ චරිත කථානායක නායිකාව ලෙස යොදාගැනීම.

සමාජයේ සෑම චරිතයක්ම නාට්‍යයට යොදාගැනීම.

අත්භූත සිදුවීම්, අවතාර, හොල්මන් යොදාගැනීම.

කාව්‍යමය බස්වහරක් යොදාගැනීම.

අංක, දර්ශන වලට බෙදා දැක්වීම (ල. 5)

(iii) පිළිතුරට අනුව ලකුණු ප්‍රදානය කිරීම. (ල. 6)

05. (i) බී. ඒ. ඩබ්. ජයමාන්න. / සිරිසේන විමලවීර (ල. 4)

(ii) ස්වභාවික රංගරීතියක් අනුගමනය කිරීම. අතුරු කථා ඇතුළත් කිරීම.
ලෝකධර්මී ලක්ෂණ ආතුළත් කිරීම. සංගීත භාවිතය ස්වභාවික රීතියට අනුකූලවීම.
ත්‍රාසය, අත්භූත සිදුවීම්, ප්‍රේමය ආදී සිද්ධීන් යොදාගැනීම. (ල. 5)

(iii) 1923 ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයීය සිංහල ශාස්ත්‍රීය සංගමය ආරම්භ වීම.
1929 ජෝන්ද සිල්වාගේ නූර්තියේ ජවනිකා කිහිපයක් රඟ දැක්වීම.
1931 චාල්ස් ඩයස්ගේ නාට්‍ය නිර්මාණ
1950 විශ්ව විද්‍යාලීය සිංහල සමිතිය ඒකාංග නාට්‍ය ඉදිරිපත් කිරීම.
1951 සිංහල නාට්‍ය මංඩලය පිහිටුවීම. සරත්චන්ද්‍ර නාට්‍ය ඉදිරිපත් කිරීම. (ල. 6)

06. (i) ඇන්ටගනී හා ක්‍රියෝන් අතර ගැටුම. ක්‍රියෝන් හා ටෙරේසියස්
හීමන් හා ක්‍රියෝන් හේවායා හා ක්‍රියෝන් ආදිය දක්වා තිබීම. (ල. 4)

(ii) නාට්‍ය පෙළ ඇසුරින් පිළිතුරු තර්කානුකූලව දක්වා තිබීම. (ල. 5)

(iii) කථානායක නායිකා ස්ථාවරත්වයේ ම දැඩි ව එල්බගෙන සිටීම.
රාජ නීතිය දැඩිව ක්‍රියාත්මක වීම. අසාධාරණය
දේව නීතිය අභිබවා යාම. සම්මත නියමයන් උල්ලංඝනය
ආදිය පැහැදිලි කර තිබීම. (ල. 6)

The National e-learning Portal for The General Education